***ප්‍රශ්නය : අවසරයි ස්වාමීන් වහන්ස, ශ්‍රී සාරානන්ද පිරිවෙන් විහාස්ථානයේ ඉතිහාසය පිළිබඳ සඳහන් කරන්න පුළුවන්ද?***

පිළිතුර : සාරානන්ද නමින් පිරිවෙන් කිහිපයක් අපේ රටේ තිබෙනවා. මුල්ම සාරානන්ද පිරිවෙන පේරාදෙණියේ සාරානන්ද විද්‍යායතන පිරිවෙනයි. අනුරාධපුරයේ සාරානන්ද පිරිවෙන පිහිටුවනු ලැබුවේ එහි ශාඛාවක් ලෙසයි. මේ පිරිවෙන් සියල්ලේම නිර්මාතෘවරයා ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ අනුනායක සියඹලන්ගමුවේ ගුණරතන ස්වමින් වහන්සේ. උන් වහන්සේ තවත් ස්වාමීන් වහන්සේලා සමඟ අනුරාධපුරයේ වැඩම කළ අවස්ථාවල රාත්‍රී කාලයේ නවාතැන් පිළිබඳව බොහෝ අපහසුතාවයන් ට මුහුණු දී තිබෙනවා. සාමාන්‍යයෙන් අපේ භික්ෂූන් වහන්සේලා මහමෙවුනා උයනේ ගස් යට තමයි නවාතැන් ගන්නේ. ඒ නිසා නායක ස්වාමීන්වහන්සේ, අනෙක් ස්වාමීන්වහන්සේලා සමඟ ගස් යට තමයි නවාතැන් ගෙන තියෙන්නෙ. එදා රාත්‍රියේ තද වැස්සකින් පීඩාවට පත් වුණ නිසා අනුරාධපුරයේ වන්දාවේ පැමිණන ස්වාමීන් වහන්සේලාට රාත්‍රී කාලයේ නවාතැන් ගන්න ස්ථානයක් ඉදි කරන්න කල්පනා කරලා තියෙනවා. එහි ප්‍රතිඵලයක් ලෙස පසු කාලයේ දී ඉසුරුමුණි විහාරයත්, ශ්‍රී මහ බොධීන් වහන්සේත් අතර තිබෙන භූමි භාගය මිලදී ගෙන ඒ ස්ථානයේ සාරානන්ද පිරිවෙන පිහිටුවනු වනු ලැබුවා. එයයි මූලික ඉතිහාසය. වන්දනාවේ පැමිණන ස්වාමීන් වහන්සේලාට කිසිදු අය කිරීමකින් තොරව නේවාසික පහසුකම් හා දාන මාන සියල්ලක්ම සැපයිය යුතු බව නායක හාමුදුරුවෝ මෙහි ආරම්භක අවස්ථාවේදී ම ප්‍රකාශ කර සිටි කාරණයක්. නායක හාමුදුරුවෝ ජීවත්ව සිටිය දී වාගේ ම අද දක්වාත් එය ක්‍රියාත්මක වෙනවා. අනුරාධපුරයේ වන්දනාවේ පැමිණෙන ස්වාමීන් වහන්සේලා දැනුම් දී පැමිණි විට උන් වහන්සේලාට දාන මාන, ගිලන්පස යන සියල්ලක්ම අදටත් සාරානන්ද පිරිවෙන සපයා දෙනවා.

***ප්‍රශ්නය : ස්වාමීන් වහන්ස, මෙයට අමතරව සමාජ වැඩ පිළිවෙලක් සිදු කරනවාද?***

පිළිතුර : නායක ස්වාමීන්වහන්සේ ජීවත්ව සිටිය දී ම උන් වහන්සේ විසින් ආරම්භ කළ කටයුත්තක් තමයි වන්දනාවේ පැමිණෙන සැදැහැවතුන් සඳහා දන්සැලක් ආරම්භ කිරීම. සාරානන්ද පොසොන් මහ බත් දන්සැල නමින් මීට අවුරුදු 27 කට පමණ කලින් එය ආරම්භ කළා. දැන් එය ශාඛා හතකින් යුක්තව පවත්වන අතර පනස්දහසකට අධික පිරිසකට පොසොන් දිනයේ දී හා ඊට පසුවදා ආහාර වලින් සංග්‍රහ කරනවා. දැන් එය විශාල සංවිධානයක් වශයෙන් පවත්වාගෙන යනවා.

සාරානන්ද පිරිවෙන් සියල්ලේම සාමාන්‍යයෙන් රටේ ක්‍රියාත්මක වන පාසල් අධ්‍යාපනය හා සමගාමීව යන පිරිවෙන් අධ්‍යාපනයක් ක්‍රියාත්මක වනවා. නමුත්

අනුරාධපුර සාරානන්ද පිරිවෙනේ ඊට වඩා සුළු වෙනස් කමක් තිබෙනවා. එහි ඇත්තේ  වාර්ෂික දාන ක්‍රමයක්. පොඩි හාමුදුරුවරු සියක් නමක් නේවාසිකව වැඩ සිටිනවා. ලංකාවේ විවිධ පලාත් වලින් පිරිස් පැමිණ දානය පූජා කරනු ලබනවා. එසේ එන අයගේ ප්‍රසාදය දිනා ගැනීම සඳහා පැරණි භික්ෂු පිළිවත් අනුව ස්වාමින්වහන්සේලා හැඩගස්වන ආයතනයක් ලෙස  අනුරාධපුරයේ සාරානන්ද පිරිවෙන ගොඩ නගනු ලැබ තියෙනවා. එය අදටත් එසේම ක්‍රියාත්මකයි. ඊට අමතරව අධ්‍යාපනයේත් යම් වෙනසක් තිබෙනවා. සෙසු පිරිවෙන් වල ඇත්තේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනයට සමාන්තරව යන අධ්‍යාපන ක්‍රමයක්. අනුරාධපුරයේ දී අපි කරන්නේ ප්‍රාචීන භාෂා අධ්‍යාපන ක්‍රමයක්. සිංහල, පාලි, සංස්කෘත භාෂා තුන විශේෂයෙන් උගන්වනවා. ඊට අමතරව නායක ස්වාමීන් වහන්සේ වැඩ සිටින කාලයේම අපි ඉංග්‍රීසි හා දෙමළ භාෂා ඉගැන්වීම ආරම්භ කරනු ලැබුවා. මේ භාෂා පහම අදටත් උගන්වනවා. සාරානන්දයෙන් පණ්ඩිත උපාධි දිනාගත් 75 නමකට වඩා ලංකාවේ විවිධ පලාත් වල සේවයේ යෙදී සිටිනවා.

***ප්‍රශ්නය : පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ ඔබ වහන්සේට විශාල අවබෝධයක් තියෙනවා. මේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනය සඳහා තිබෙන අභියෝග මොනවාද?***

පිළිතුර : පිරිවෙන් අධ්‍යාපනය, අපේ සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධානතම අංගයක්. මේ අධ්‍යාපනය වෙන් වෙලා තිබුණේ භික්ෂූන් වහන්සේලා සඳහා. භික්ෂූන් වහන්සේ නමක් වූ විට උන් වහන්සේට මූලික වශයෙන් පාලි මාගධී භාෂාව පිළිබඳ දැනුම අවශ්‍ය කරනවා.  ඒ භාෂාවෙන් තමයි ත්‍රිපිටකය සම්පූර්ණයෙන් ම ලියලා තියෙන්නෙ. ඒ නිසා පාලි භාෂාව දන්නේ නැහැ කියන්නේ බණ දන්නේ නැහැ කියන එකයි. වෙන ආකාරයකින් කියනවා නම් බණ කියන්නත් බැහැ. බණ දන්නෙත් නැහැ.

ඒ නිසා පිරිවෙන් අධ්‍යාපනය සකස් විය යුත්තේ පාලි, සංස්කෘත හා සිංහල යන භාෂා තුන මුල් කරගෙන. අද අපි භාවිතා කරන සිංහල භාෂාවෙහි ඇත්තේ මේ කියන භාෂා තුනෙහි සංකලනයක්. සංස්කෘත හා පාලි වචන සිංහල භාෂාවට බොහෝ ඇතුල් වෙලා තියෙනවා. අද අපේ රටේ විදග්ධ ප්‍රඥාවන්තයන් වශයෙන් සිටිනවා නම් ඇත්තේ පිරිවෙන් අධ්‍යාපනය තුළින් බිහි වූ ප්‍රවීන අයයි. කථිකාචාර්යවරු, මහාචාර්යවරු වගේ බුද්ධිමත් සියලු දෙනාම ඔය භාෂාත්‍රය හදාරා පැමිණි අය. පාසල් අධ්‍යාපනයට බොහෝ දෙනා කැමති එය රැකියාවකට වැදගත් වන නිසා. පිරිවෙන් අධ්‍යාපනය තුළින් බලාපොරාත්තු වන්නේ රැකියාවක් ලබා ගැනීම නෙවෙයි. එයින් බලාපොරොත්තු වන්නේ තමන්ගේ භාෂාව පිළිබඳ ගැඹුරු දැනුමක්. නිවැරදි වැටහීමක්, අවබෝධයක් ලබා ගැනීම. මේ භාෂා ඥාණයත් සමග සංස්කෘතිය, ධර්මය, එම ධර්ම විග්‍රහ කිරීමේ හැකියාව, එය අන් අයට

සන්නිවේදනය කිරීමේ හැකියාව වැනි දේ සඳහා ඉගැන්වීමට ප්‍රමුඛස්ථානය ලබා දෙනවා.

නමුත් දැන් සිටින බොහෝ තරුණ ස්වාමින්වහන්සේලා රැකියා අවස්ථාවක් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් ප්‍රාචීන අධ්‍යාපනයෙන් බැහැරට යාමට කල්පනා කරනවා. ඕනෑම රජයක් විසින් කළ යුතු ම දේ නම් පන්සල කේන්ද්‍ර කොට ගත් පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමයි. එය තමයි දැන් තියෙන අභියෝගය.

***ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, ඒ සඳහා ප්‍රශ්නයක් ව ඇත්තේ සම්පත් ද? නැතිනම් රජයෙන් නායකත්වයක් අවශ්‍ය වෙනවාද? එහෙම නැතිනම් ස්වාමින් වහන්සේලා අතරම නායකත්වයක් අවශ්‍ය වෙනවාද?***

පිළිතුර : සැලකිලිමත් නොවීම නිසා ස්වාමින්වහන්සේලාගේ පැත්තෙනුත් අඩුපාඩුවක් වෙලා තියෙනවා. කලින් ප්‍රධාන වශයෙන් අපේ තිබුණේ විද්‍යාලංකාර හා විද්‍යෝදය යන ආයතන දෙක. ඊට අමතරව වෙනත් ප්‍රදේශ වල තිබුණේ පිරිවෙන් කිහිපයක් පමණයි. ඒවාත් දැන් පෙර කී සංකීර්ණ ප්‍රශ්නයට මුහුණ දී තිබෙනවා. ඒ නිසා ස්වාමින්වහන්සේලාගේ පැත්තෙනුත් මෙය ශක්තිමත් කරන්න අවශ්‍යයි. ධර්ම සන්නිවේදනයේ වුවත් අපිට විවිධ ගැටළු තිබෙනවා. බොහෝ දෙනෙක් චෝදනා කරනවා මිනිස්සු බණ අහන්න එන්නේ නැහැ කියලා. මම එයට එකඟ වන්නේ නැහැ. අහන්න පුළුවන් බණ කියන්න අවශ්‍යයි. එවිට එනවා. එන්නේ නැහැ කියලා අපි පැත්තකට දානවාට වඩා අහන්න වටින, නැතිනම් සැබෑ ධර්මය දේශනා කළාම එයට එකතු වෙන්න මිනිස්සු බොහෝම කැමතියි. ඒ සඳහා මේ පොඩි හාමුදුරුවරු, තරුණ හාමුදුරුවරු ශක්තිමත් කරන්න පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය මූලික ආරම්භයක් විය යුතුයි.

***ප්‍රශ්නය : බණ අහන්න පැමිණෙන්නේ නැහැ කියන අදහස ඔබ වහන්සේ මෙහිදී මතු කළා. අපි මීට වඩා බුද්ධාගම කොහොම ද සිසුයෙන් ඉදිරියට ගෙනියන්න පුළුවන් කියලා මේ මොහොතේ දී හිතන්න අවශ්‍ය වෙනවා. අද ලෝකයේ බුද්ධ ධර්මයට විශාල අවස්ථාවක් තියෙනවා. තාක්ෂණික යුගය තුළ විදේශිකයන් පවා බුද්ධ ධර්මය ගැන උනන්දුවක් දක්වනවා. නමුත් දේශීය වශයෙන් නොයෙක් ප්‍රශ්න තියෙනවා. සමහරුන්ගේ මතය තරුණ තරුණියන් ධර්මයෙන් ඈත් වෙනවා කියලා. අපි අපේ සංස්කෘතියෙන්, ධර්මයෙන් ඈත් වෙන එක භයානකයි. ඒ නිසා ඔබවහන්සේට පෙනන ආකාරයට මේ සඳහා තියෙන අභියෝග හා අවස්ථා මොනවාද?***

පිළිතුර : අපි ශාස්තෘවරුන් බෙදා ගෙන තියෙනවා. ඒ නිසා සමාජය වෙන වෙනම කණ්ඩායම් වශයෙන් බෙදිලා. බුදුන් වහන්සේ අපේ කියලා. එතකොට බෞද්ධ

පිරිසට පමණයි බුදුන් වහන්සේ සීමා වන්නේ. නමුත්, විය යුත්තේ එය නෙමෙයි. බුදුරජාණන් වහන්සේ කියලා කියන්නේ මේ සියලුම සත්ව සංහතිය වෙනුවෙන් පහළ වූ ශාස්තෘවරයෙක්. බෝසතාණන් වහන්සේගේ සිද්ධාර්ථ කුමාර චරිතය විමසා බැලූවිට මේ කාරණය පැහැදිලි වෙනවා. මේ සමාජයේම ඉපදී, හැදී වැඩුනු එතුමාට තිබුණේ එක අවශ්‍යතාවයයි. එය තමයි සත්‍ය සෙවීම. සත්‍ය කුමක් ද කියා සෙවීමට එතුමාට විශාල වුවමනාව තිබුණා. පොත් පත් වල උගන්වන්නේ ''කිං සච්ච ගවේශි'', ''මොකක්ද මේ සත්‍ය'' යන්න සොයන්න අවශ්‍යතාව තිබුණ බවයි. ඒ සඳහා ගියේ ගුරුවරු ළඟට. භාර්ගව, ආලාරකාලාම, උද්දකරාම පුත්‍ර වැනි තාපසයන් වෙත පිළිවෙලින් ගියා. භාර්ගව තාපසයා බොහෝම ප්‍රසිද්ධ ගුරුවරයෙක්. එතුමාගෙන් අවසානය දක්වා ඉගෙනගෙන බැලුවා. නමුත් එතැන සත්‍ය සොයන ක්‍රමයක් නැහැ. ඊළඟට ගියා ආලාර කාලාම තවුසා ළඟට. එතැන ගොස් ඉගෙන ගත්තා අකිඤ්චඤ්ඤායතන ධ්‍යානය දක්වා. එතැනින් අවසානයි. අද කාලේ හැටියට නම් ලබා දෙන අවසාන සහතිකය. නමුත් එතැනින් ද අරමුණ ඉටු වුනේ නැහැ. අනතුරුව උද්දකරාමපුත්‍ර තවුසා වෙත ගියා. එතුමා ළඟ නෙවසඤ්ඤා ඤාසඤ්ඤායතන දක්වා උසස් අධ්‍යාපනයක් තිබුණා. එයත් තමන්ගේ ප්‍රශ්නයට විසඳුමක් නොවන බව බෝසතානන්ට පෙනි ගියා. සත්‍ය එතැනින් ද දැන ගත නොහැකි බව අවබෝධ කර ගත්තා. ඒ නිසා එතුමා කල්පනා කළා මම මෙය තනිවම හෝ සොයා ගන්නා බව. ඉන්පසුව ගයාව දෙසට ගිහින් ඇසතු බෝධි මූලයේ දැඩි අධිෂ්ඨානයෙන් යුතුව සත්‍ය සෙවීමේ ව්‍යායාමය ආරම්භ කළා.

උන්වහන්සේට අවශ්‍යතාවය තිබුණේ එක් කණ්ඩායමක් පමණක් ගලවා ගැනීමවත්, එක් කණ්ඩායමකට පමණක් සේවය කිරීමවත් නොවෙයි. පරමාර්ථය වුයේ ලෝකයේ සත්‍ය කුමක් ද කියා සොයා ගැනීම. අවසානයේ දී උන් වහන්සේ එය සොයා ගත්තා. ඒ නිසයි බුද්ධත්වය ලබා ගත් අවස්ථාවේ ම සතුට ප්‍රකාශ කරමින් ''අනේක ජාති සංසාරං, සන්ධා විස්සං අනිබ්බිසං'' කියලා ගථාවකින් ප්‍රකාශ කළේ ''මේ සසර නැමති ගෙය හදන වඩුවා, නිර්මාණකරුවා සොයා ගෙන මා පැමිණියා. දැන් මා ඔහුව අල්ලා ගත්තා. ඒ තෘෂ්ණාව නම් නිර්මාණකරුවා අත්අඩංගුවේ සිටින නිසා මින් පසු ඒ ගෙය හදන්න බැහැ'' කියලා. මේක තමයි ලෝකයේ සත්‍ය. ඒ නිසා බුද්ධ වචනය, බුද්ධ ධර්මය එක කණ්ඩායමකට හෝ රටකට සීමා වුණ එකක් නෙමෙයි. එය මුළු ලෝකයේ ඕනෑම කෙනෙකුට එදාටත්, අදටත් වලංගුයි. 'අකාලිකයි' කියලා කියන්නේ ඒ නිසයි. කාලයක් නැහැ. බුද්ධ ධර්මය ඕනෑම කාලයකට වලංගු ධර්මයක්. මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වඩින විට උන් වහන්සේ ගෙනාපු දෙයක් නැහැ. උන්වහන්සේ අරගෙන වැඩියේ මේ චින්තනය. ඒ චින්තනය අපේ රටේ මිනිස්සුන්ගේ හදවත් වල තැන්පත් කළා. ප්‍රධාන වශයෙන් ඒ සඳහා තෝරා ගත්තේ රාජ්‍ය පාලකයා.

අශෝක රජතුමා තෙවැනි ධර්ම සංගායනාව සිදු කර අවසන්ව රටවල් නවයකට ධර්ම දූතයන් වහන්සේලා පිටත් කළ කාල වකවානුවේ අනෙක් ධර්මදූතයන් වහන්සේලා ඒ ඒ රටවලට වැඩම කළා. නමුත් මිහිඳු මහ රහතන් වහන්සේ අපේ රටට වැඩියේ නැහැ. එවකට අපේ රටේ රාජ්‍ය පාලනය කළේ මුටසීව රජතුමා. එතුමා සිටියේ මහලු වයසේ. ඒ නිසා වේදිසගිරියට වැඩම කරලා මාස 06 ක් කල් ගත කළා. සමහර තැන් වල සඳහන් වෙනවා උන් වහන්සේ ඒ කාලය තුළ දෙමාපියන්, නෑයන් මුණගැසී කාලය ගත කළා කියලා. තවත් තැන් වල ඒ අපේ රටේ භාෂාව ඉගෙන ගත්තා කියල සඳහන් වෙනවා. කොහොම හරි සුදුසු කාලය එනතුරු මාස 06 ක් කල් ගත කළා. මුටසීව රජතුමාගෙන් පසුව රජබවට පත් වුයේ දේවානම්පියතිස්ස රජතුමා.  ඔහු මැදි වයසේ කෙනෙක්. එතුමා තරුණයි. බුද්ධිමත්. මෙසේ ධර්මය එත්තු ගන්වන්න සුදුසු කාලය පැමිණෙන තුරු සිටියා. මුටසීව රජතුමාට මේ ධර්මය දේශනා කළා නම් ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. සතියක් දෙකක් ජීවත්වෙලා මැරිලා යයි. එතැනින් සියල්ල අවසානයි. ඒ නිසා එහෙම කළේ නැහැ. ඒ නිසා මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කළේ දේවානම්පියතිස්ස කුමාරයා රජ බවට පත් වෙනතුරු කල් බැලීමෙන් පසුව. ප්‍රථමයෙන් මේ ධර්මය දේශනා කිරීම සඳහා තෝරා ගනු ලැබුවෙත් රටේ රජතුමා. එයත් බොහෝම වටින දෙයක්. ඕනෑම රටක, සමාජයක චින්තනය ගලාගෙන යන්නේ ඉහළ තැනකට සිට පහළට. විශේෂයෙන් පෙරදිග රටවල් හැඩ ගැසිලා තියෙන්නේ ඒ ආකාරයට. රටේ නායකයා අනුගමනය කරන ප්‍රතිපත්තිය කුමක් ද? රටවැසියාත් එයම අනුගමනය කරනවා. ඒ නිසා මුලින් ම බණ කියන්න තෝරා ගත්තේ රජ්ජුරුවන්ව. එහිදි දේශනා කළ සූත්‍රයත් වැදගත්. දේශනා කළේ චුල්ලහත්ථිපදෝපම සූත්‍රය. එදා රටවැසියන්ට වනය කියන එක බොහෝම වැදගත්. එදත් රජතුමා සිටියේ දඩකෙළියේ නිසා එය පැහැදිලි වෙනවා. ඒ නිසා මිහිඳු මහ රහතන් වහන්සේ තෝරා ගත්තේ කැලෑව ආශ්‍රිතව බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ සූත්‍රයක්. මම මෙයින් කියන්න උත්සාහ කළේ කලින් සඳහන් කළ කාරණාවමයි. මිනිස්සු බණ අහන්නේ නැහැ කියන එක කියනවාට වඩා අහන්න පුළුවන් බණ කියන්න ඕනේ කියන එකයි වැදගත්.

***ප්‍රශ්නය : ඒ ආදර්ශයෙන් අපට යමක් ඉගෙන ගන්නත්, මේ යුගයට ගැලපෙන ආකාරයෙන් ඒ සඳහා ගමනක් යා යුත්තේත් කොහොමද?***

පිළිතුර : ඒ සඳහා ලබා දිය යුතු පණිවිඩයේ බොහෝ දේ තියෙනවා. පළමුදේ තමයි පාලක පිරිස නිවැරදි ධර්මයක පිහිටුවීමට කටයුතු කිරීම. එය කළ යුතු ධර්මයෙන්. ඒ නිසයි මා කියා සිටියේ ඒ චින්තනය තුළ කියලා. මේ ලෝකය තුළ ක්‍රියාත්මක වන චින්තන ධාරා දෙකක් තියෙනවා.

පෙරදිග චින්තනය




මෙය තමයි පෙරදිග චින්තනය. හිරු, සඳු දෙපැත්තෙන් ඊළඟට ස්වභාව ධර්මය. එතැනින් පහළට පෘථිවිය, මේඝය, ගංගා ඇළ දොල, වෘක්ෂලතා, සත්ව ප්‍රජාව හා වාතය යන මේ සියල්ලක්ම මේ රාමුව ඇතුළේ. අපේ පැරැන්නන් මේ සඳහා අර්ථ කථනයක් දුන්නා. පෘථිවියට මව. මේඝයට පියා, ගංගාවලට මිත්තනිය ආදි වශයෙන්. එය පෘථිවිය මත අප සියලු දෙනා ජීවත් වන නිසා පෘථිවිය මව වශයෙන් සැලකුවා. ඒ නිසා මව ප්‍රධාන කොට සැලකුවා. මව පෝෂණය වන්නේ, රැකෙන්නේ පියාගෙන් නිසා මේඝය පියා ලෙස සලකා අර්ථකථනයක් දුන්නා.

අනෙක් චින්තනය තමයි බටහිර චින්තනය.

දෙවියන් වහන්සේ




ස්වභාව ධර්මය

බටහිර චින්තනයේ මේ රාමුව ඇතුළේ ඉන්නේ එක්තරා කොටසක්. එයින් පිටත දෙවියන් වහන්සේ හා ස්වභාව ධර්මය තියෙනවා. මේ රාමුව තුළ තමයි අනෙක් සියල්ල තියෙන්නේ. එහි තේරුම දෙවියන් වහන්සේ මුලින් ම මිනිසා මැව්වා. ඊළඟට එයාගේ සහායට ගැහැණිය මැව්වා. (ආදම් සහ ඒව) අනෙක් සියල්ලක්ම මවන ලද්දේ මිනිසාගේ ප්‍රයෝජනය සඳහා. දැන් බලන්න මේ චින්තන දෙකෙහි වෙනස. පෙරදිග චින්තනයේ වගේ අන්‍යොන්‍ය සම්බන්ධයක් බටහිර චින්තනයේ

නැහැ. මිනිසාගේ ප්‍රයෝජනය සඳහා මේ සියල්ලක්ම මවලා තියෙනවා. ඒ නිසා බටහිර චින්තනය ගරු කරන ඕනෑම කෙනෙකුට තමාගේ යැපීම සඳහා ඕනෑම දෙයකින් ප්‍රයෝජන ගන්න පුළුවන්.

***ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, බටහිර ලෝකයත් අද පෙරදිග චින්තනය දෙස බලනවා නේද?***

පිළිතුර : ඔව් අද එහෙම වෙලා. නමුත් අපි කොයි චින්තනයේද ඉන්නේ කියලා රටක් වශයෙන් හෝ පුරවැසියන් වශයෙන් හෝ අපි දන්නේ නැහැ. අපි ඉන්නේ මිශ්‍ර වෙලා. වැරැද්ද එතැන.

***ප්‍රශ්නය : දැන් අපිට ප්‍රශ්නය වෙලා තියෙන්නේ අපි කවුද කියලා හරියට දන්නේ නැති එක?***

පිළිතුර : ඔව් ඒක ඇත්ත. අපි අපේ බෞද්ධයන් ගැන බලමු. මළ ගෙදරක් ගත් විට එහි මිය ගිය කෙනාට පිං අනුමෝදන් කරන්න ආගමික උත්සවයක් පවත්වනවා. බුදු දහමට අනුව කෙනෙක් මිය ගියා පසුව ඒ මළ කුණ තමයි ඒ එන යන අයට තමන්ගේ ජීවිතය පිළිබඳ පාඩමක් ඉගෙන ගන්න තියෙන කදිම දෘෂ්‍යාධාරය. මළ ගෙදර තියෙන්නේ ඒ සඳහා. නමුත් අද මළ ගෙදර උත්සවයක් වෙලා. දන්සැල වගේ යන එන අය සියලු දෙනාටම කන්න දෙනවා. බොන්න එන අයට බොන්නත් දෙනවා. සෙල්ලම් කරන්න එන අයට සෙල්ලම් කරන්නත් දෙනවා. ඒ නිසා මැරෙන තරමට මිනිස්සු දැන් කැමතියි. මැරෙන තරමටත්, මළ මිනිය තියා ගන්න තරමටත් කැමතියි. වෙනදා තැබෑරුමට ගිහිල්ලා සල්ලි දීලා බොන මනුස්සයාට මෙතැන් දී නොමිලේම බොන්නත් ලැබෙනවා.

***ප්‍රශ්නය : ධර්මය අපි පදක්කමක් වගේ පැළඳගෙන යනවා මිසක් එහි ගැඹුරට ගිහිල්ලා නැහැ. වෙසක්, පොසොන් වගේ උත්සව ගැන වුනත් එහි ගැඹුර පිළිබඳව අපිට හරි අවබෝධයක් නැහැ. මතුපිටින් විනෝදයට තමයි හුරු වෙලා තියෙන්නේ.***

පිළිතුර : ආමිෂ, ප්‍රතිපත්ති කියලා පූජා දෙවර්ගයක් තියෙනවා. බුදුරජාණන් වහන්සේ එයින් වැඩි වශයෙන් අගය කළේ ප්‍රතිපත්ති පූජාව. ආමිෂ පූජාව ප්‍රතික්ෂේප කළා නෙමෙයි. එය එපා කියලා දේශනා කළේ නැහැ. නමුත් වැඩි අවධානයක් යොමු කළේ ප්‍රතිපත්ති පූජාවට. අපි දැන් කරන්නේ ප්‍රතිපත්තිය පැත්තකට දාලා, ආමිෂයට මුල් තැන දෙන එකයි. ඒ අනුව අපිත් කිසි අවබෝධයක් නැතිව කරන්නන් වාලේ කරනවා. කියන්නන් වාලේ කියනවා. ප්‍රතිපත්ති ගරුක නොවීම නිසා යාඥා, කන්නලව් කරනවා වගේ තත්ත්වයට පත්

වෙලා. මම පසුගිය අවුරුද්දක කාලය තුළ කොළඹ සිටියා. වාහන වලින් ඇවිල්ලා ධම්මපදය, සද්ධර්මරත්නාවලිය, ජාතක පොත් වහන්සේ වගේ පොත් බෝධින් වහන්සේ ලඟ රාත්‍රි 11 පමණ වන තෙක් හිඳගෙන කියවනවා. මම දවසක් අම්මා කෙනෙක් ගෙන් ඇහුවා ''මොකද අම්මේ රෑ වෙනතුරු මේ පොත් කියවන්නේ ඇයි'' කියලා. මට දුන්න උත්තරේ තමයි ''මහත්තයා දැන් සුමානයක විතර ඉඳලා ගෙදර එන්නේ නැහැ'' කියලා. කොහොමත් පොත කියෙව්වාට මහත්තයා ගෙදර එන්නේ නැහැ. එහෙම ධර්මයක් නැහැනේ. මේක තමයි අවබෝධය.

මේ දවස් වල උසස් පෙළ විභාගය තියෙනවා. ප්‍රවේශපත්‍රයත් ඇවිල්ලා. දරුවා සමඟ පන්සලට ගිහිල්ලා බෝධි පූජාවක් තියන්නේ විභාගය හෙට කියලා. බෝධි පූජා වැඩි නිසා විභාගයක් තියෙන විට ස්වාමින්වහන්සේලාට වැඩත් වැඩියි. සම්මාන බෙදිලා යන නිසා බෝධි පූජා එකට තියන්නත් කැමති නැහැ. තමන්ගේ දරුවන්ට වැඩියෙන් සම්මාන ගන්න තමයි බලන්නේ. ඒ නිසා එක්කෙනාට එක බෝධි පූජාව බැගින් තියන්න වෙනවා. බෝධි පූජාවක් තිබ්බා කියලා විභාගය සමත් වෙන්නේ නැහැ. මිත්‍යාව තියෙන්නේ එතැන. ළමයෙක් විභාගය සමත් වෙයි කියලා දෙමාපියන් බලාපොරොත්තු වෙනවානම් ප්‍රවේශ පත්‍ර ලැබුණ දවසේ බෝධි පූජාවක් තියලා වැඩක් වෙන්නේ නැහැ. කළ යුතුව තියෙන්නේ විභාග වර්ෂයට, සාමාන්‍ය පෙළ නම් ඒ පංතියට ළමයා සමත් වු දවසේ දෙමාපියන්, තම දරුවා පන්සලට කැඳවාගෙන ගිහින් ස්වාමින්වහන්සේ ලවා බෝධි පූජාවක් තියලා දරුවාට විභාගය මතක් කරලා දෙන්න අවශ්‍යයි. අවුරුද්ද අවසානයේ විභාගය හොඳින් මුහුණ දෙන්න අධිෂ්ඨානයක් ඇති කරවන්න අවශ්‍යයි. ඒ වගේම වරින් වර බෝධි පූජා පවත්වමින් මේ අධිෂ්ඨානය මතක් කර දෙන්න අවශ්‍යයි. මෙය තමයි බෝසත් චරිතය මගින් අපි පෙන්වා දීලා තියෙන්නේ. බුදු දහමේ එක වචනයක් තියෙනවා ''විරියෙන දුක්ඛං අච්චේන්ති'' කියලා. දුක් නැති කරන්න, ජයග්‍රහණය කරා යන්න පුළුවන් වන්නේ වීර්යයයෙන් පමණයි. අලසයන්ට බැහැ. එය බෝධිසත්ව චරිතයෙන්ද පෙන්නා දුන්නා. බෝධිසත්වයන් වහන්සේ බුදුවෙන්න අවශ්‍යයි කියලා ප්‍රාර්ථනාවක් කළා. මැණියන් ද ආශිර්වාද කළා. දීපංකර බුදුරජාණන් වහන්සේත් නියත විවරණ දුන්නා. විවරණ දීලා නිකං හිටියානම් බුදු වෙන්නේ නැහැ. එතුමා එදා ඉඳලා, මෙයට කලින් බුදු වු අය කුමක් ද කළේ කියා සොයා බලමින් සුදනම් වුණා. දාන පාරමිතා, ශීල පාරමිතා, නෙක්කම්ම පාරමිතා අදි වශයෙන් පාරමිතා සම්පූර්ණ කළා. එහි ප්‍රතිඵලය තමයි බුද්ධත්වය ලබා ගැනීම. අපේ විභාග වලට පෙනී සිටින දරුවන්ටත් මා කියන්නේ ඔබ විභාග වසරට සමත් වු විට බෝධි පූජාවක් තබා ආශිර්වාද ලබා ගන්න. එහි ආනිශංසයක් තිබෙනවා. බෝධින් වහන්සේ අධිෂ්ඨානයක් ඇති කර ගන්න හොඳම තැන. චතුරංග සමන්නා ගත වීරිය ඇති කර ගත්තේ ඔතැන දී. එය ජයග්‍රහණයේ සංකේතය. ඒ නිසා ඕනෑම කෙනෙකුට බෝධින් වහන්සේ ළඟට ගිහිල්ලා

අධිෂ්ඨානයක් ඇති කර ගන්න පුළුවන්. හැබැයි අධිෂ්ඨානයක් ඇති කර ගත්තා කියලා ප්‍රතිඵල සම්පූර්ණ වෙන්නේ නැහැ.

***ප්‍රශ්නය : බොහෝ දෙනාට ධර්මය ගැන අවබෝධය තියෙන්නේ මතු පිටින්. ඒ පිළිබඳ කරන්න පුළුවන් කුමක් ද ස්වාමීන් වහන්ස?***

පිළිතුර : අද කාලීන ධර්ම දේශනා කියලා අලුත් වචනයක් හදාගෙන තිබෙනවා. බුදුහාමුදුරුවන්ගේ ධර්මය සර්ව කාලීනයි. මේ භාවිතය සන්නිවේදන ක්‍රමයේ දුර්වලතාවක්. එය නිවැරදි කර ගැනීම සඳහා අපේ වැඩිහිටි හාමුදුරුවරු හෝ බෞද්ධ ආයතන හෝ ක්‍රියාත්මක වෙන්න අවශ්‍යයි. දැන් ඉන්න තරුණ ස්වාමීන්වහන්සේලාට ධර්ම සංනිවේදනය පිළිබඳ ප්‍රායෝගික අවබෝධයක් ලබා දෙන්න වැඩපිළිවෙලක් සකස් කරන්න අවශ්‍යයි. පොත් පත් වලින් ලැබෙන දැනුම තිබෙනවා. නැත්තේ එය අවස්ථානුකූලව සම්බන්ධ කර ගැනීමේ ගැටළුව. බුදුහාමුදුරුවන්ගේ ක්‍රමය තමයි ධර්මය අහන්න පැමිණි පුද්ගලයාගේ ස්වභාවය බලා කරුණු දේශනා කිරීම. මෙය අමුතු දෙයක් නෙමෙයි. පිටතින් ගෙනල්ලා එන්නත් කරපු දෙයක් නෙමෙයි. ගොවියෙක් පැමිණියහොත් බුදුහාමුදුරුවෝ අහන්නේ මොකද ඔබ කරන්නේ. 'හාමුදුරුවනේ මං ගොවිතැන කරන්නේ'. මමත් ගොවිතැන් කරනවානේ කියලා උන්වහන්සේ කියනවා. එහෙම තමයි බුදුහාමුදුරුවෝ පටන් ගන්නේ.

මමත් ගොවිතැන් කරනවා. හැබැයි මම ගොවිතැන් කරන්නේ ඔය වාගේ කුඹුරු නෙමෙයි. මං ළඟ ශ්‍රද්ධාව නම් වූ බීජ තියෙනවා. තපස නම් වූ කුඹුරක් තියෙනවා කියලා බුදුහාමුදුරුවෝ කියනවා. එසේ කියලා මේ තමයි කියනවා මගේ අස්වැන්න. මෙම අස්වැන්න වැඩි කර ගන්න නම් මේ මේ දේ කරන්න අවශ්‍යයි. කළට වේලාවට කුඹුර සකස් කරන්න අවශ්‍යයි. එය පිළිබඳ සෙවිල්ලෙන් ඉන්න අවශ්‍යයි. බීජ තෝරා බේරා ගන්න අවශ්‍යයි. හොඳ බීජ වපුරන්න අවශ්‍යයි. අවශ්‍ය සත්කාර කරන්න අවශ්‍යයි. මේ ආකාරයෙන් තමන් කරන කටයුත්ත හා ධර්මය බද්ධ කරලා බුදුහාමුදුරුවෝ ධර්මය දේශනා කරනවා. එවිට අර පුද්ගලයාට හිතෙනවා බුදුහාමුදුරුවෝ කියන්නේ මං ගැනමනේ. මේ කියන්නේ මං කරන වැඩෙන් ඉහළම ප්‍රතිඵලයක් ලබා ගන්න කියලා පැහැදෙනවා.

***ප්‍රශ්නය : ස්වාමීන් වහන්ස, මේ පිළිබඳ ගිහි සමාජයෙන් කරන්න අවශ්‍ය වන්නේ කුමක් ද ?***

පිළිතුර : පාර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේදය කියලා බුදු දහමේ තියෙන්නේ පියවර තුනයි. ධර්මයේ ප්‍රතිඵල ලබා ගන්න නම් මේ පියවර තුනම අනුගමනය කරන්න අවශ්‍යයි. මෙය පඩිපෙළ වගේ සකස් වුණ දෙයක්. පාරියාප්තිය කියන්නේ හොඳට ධර්මය, අසා තේරුම් ගැනීමයි. හැබැයි පරියාප්තිය සම්පූර්ණ කළා කියලා ප්‍රතිඵල

නැහැ. දෙවැනි කාරණය තමයි ප්‍රතිපත්තිය. ප්‍රතිපත්තියක පිහිටියා කියලාත් ප්‍රතිඵල ලැබෙන්නේ නැහැ. මේ දෙකෙන් ම ලබන අවසාන ප්‍රතිඵලය තමයි ප්‍රතිවේදය. ධර්ම හොඳින් දැන ගන්න අවශ්‍යයි. ප්‍රතිපත්තියක පිහිටන්න අවශ්‍යයි. ප්‍රතිඵල ලැබෙන්නේ එසේ පිහිටීම තුළින්. අපේ අයට වෙලා තියෙන්නේ බණ දන්නවා. නමුත් ක්‍රියාත්මක නැහැ. ඒ නිසා දොස් කිය කියා ඉන්නවා. අපි හතර පොහොයට සිල් ගන්නවා. භාවනා පංති කියකට ගියාද? නමුත් කිසිම ප්‍රතිඵලයක් නැහැනේ යන මතයේ ඉන්නවා. ඒ නිසයි මෙහෙම සිදු වෙලා තියෙන්නේ.

***ප්‍රශ්නය : අපේ සමාජය තුළ ග්‍රහ චාරය, නැකත් පිළිබඳ ලොකු උනන්දුවක් තියෙනවා. මේ කරුණු හා ධර්මය අතර ඇති සම්බන්ධතාවය කුමක්ද?***

පිළිතුර : කලින් සඳහන් කළ පෙරදිග දර්ශනය පිළිබඳ සටහන දෙස බැලූ විට මේ ස්වභාව ධර්මයේ සියල්ලත්, හිරු සඳු ඇතුළු කොට ඇති ගස් කොළන් යන සියල්ලේම අන්‍යොන්‍යය සම්බන්ධයක් තිබෙන බව පෙනී යනවා. එම නිසා මේ ග්‍රහ තාරකාවන්ගේ ගමන් මඟ සහ ගමනේ ස්වභාවය අනිවාර්යයෙන් ම අනෙකුත් දේ සඳහා යම් බලපෑමක් කරනවා. කිසිම කෙනෙකුට එසේ නොවන බව කියන්න බැහැ. ලංකාවට අධික උෂ්ණය කියලා අපි එක කාලයකට කියනවා. හේතුව සූර්යයා අපට හරි කෙලින් ගමන් කිරීම. එය ඒ ආකාරයෙන්ම බලපා තිබෙනවා. ඒ නිසා ග්‍රහ වස්තූන්ගේ බලපෑම අපට තියෙනවා. මෙය නිසි ආකාරයෙන් සොයා බලා ශාස්ත්‍රානුකූලව හදාරපු ක්‍රමය ජ්‍යොතිෂ්‍ය. මෙහි බලපෑමක් නැතැයි කියලා කියන්න බැහැ. විද්‍යානුකූව ඉදිරිපත් කළත්, නොකළත් මේ තියෙන ක්‍රමයට අනුව මේ සියල්ලේ ම අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් තිබෙන නිසා එක් දෙයක ක්‍රියාත්මක වීම සෙසු ඒවාට බලපානවා. මිනිස්සුන්ගේ ක්‍රියාකාරිත්වය ලෝක පැවැත්මට දැන් බලපා තිබෙනවා. ඕසෝන් ස්ථරය දැන් දියවෙන්න පටන් අරගෙන. මෙය ඉබේම සිදු වූ දෙයක් නෙමෙයි. අපේ ක්‍රියාකාරකම් එයට බලපා. එහි ප්‍රති ක්‍රියාකාරකම් නැවත ආපසු අපිටත් බලපා තියෙනවා.

***ප්‍රශ්නය : අද සමාජයේ ග්‍රහචාරය මතම පමණක් ක්‍රියාකරන ජන කොටසකුත් ඉන්නවා. ඒ නිසා ඔබවහන්සේගේ චින්තනට අනුව කොහොම සමබරව අපි මේ ගමන යන්නේ?***

පිළිතුර : මෙහිදි අපි අන්තගාමී වෙන්න හොඳ නැහැ. මම හඳහන බලලා ග්‍රහචාරය නරකයි කියලා සියලුම වැඩ නවත්වලා නිකං සිටියහොත්, මට ඒ වැඩ කොටස නැවත කිසි දිනක කරන්න හැකියාවක් නැහැ. මේ සඳහා තමයි බුදුහාමුදුරුවන් මධ්‍යම ප්‍රතිපදව කියලා දෙයක් ඉගැන් වූයේ. කිසිම දෙයකින් හෝ අන්තගාමී වුවහොත් ඒ පුද්ගලයාට එයින් ඉදිරියට යන්න බැහැ. ඒවා ගැන දැන ගත්තාට ප්‍රශ්නයක් නැහැ. අපිත් ඒවා පිළිබඳ හදාරනවා. කියවනවා. ඒවා පිළිබඳත්

දැනගෙන ඒවායේ සත්‍ය අසත්‍ය භාවය පිළිබඳ තේරුම් ගෙන මධ්‍යස්ථව කටයුතු කිරීම වැදගත්. කෙනෙකුට අභිවෘද්ධිය කරා යන්න හැකි වන්නේ ඒ අනුවයි.

***ප්‍රශ්නය : සමාජය ගමන් කරන්නේ ඔබ වහන්සේ පවසන චින්තනය හරහා නෙමෙයි. ඒ නිසා අපි මේ ගමනට යම් පරිවර්ථනයක් ආරම්භ කරන්න අවශ්‍ය වෙන්නේ කොතැනින්ද ස්වාමීන් වහන්ස?***

පිළිතුර : ඇත්ත වශයෙන් ම මේ වෙනස ආරම්භ කරන්න අවශ්‍ය රටේ පාලක පිරිස. තීරණ ගන්නේ ඒ අය. ඒ තීරණ ගන්න පිරිස නිවැරදි චින්තනයක සිටියේ නැතිනම් වැරදි ආකාරයෙන් ගන්නා තීරණ බලපාන්නේ රට වැසියන්ට. එහි විපාක විඳින්නේ අපි. ඒ නිසා තමයි මිහිඳු මහ රහතන් වහන්සේ දින හතක් මහජනයා ට එක දිගට බණ දේශනා කරලා අවසානයේ දේවානම් පියතිස්ස රජතුමාට රාජෝවාද සූත්‍රය දේශනා කළා. එය රජ්ජුරුවන්ට ම දේශනා කළ බණක්. එහි තියෙනවා ගව රැලක නායකයා ඇළකින් එගොඩ වන විට හොඳ හැටි තේරුම් ගෙන නිවැරදි තැනින් එගොඩ වුයේ නැතිනම් පිටුපසින් එන සියලු දෙනාම ආමාරුවේ වැටෙනවා බව ඒ නිසා අපේ ජන නායකයෝ නිවැරදි චින්තනයක ගමන් කළහොත් ඕනෑම රටක්, සමාජයක් නිවැරදිව සෞභාග්‍ය කරා ගෙනියන්න පුළුවන්. එහි කිසිම ගැටළුවක් නැහැ. වරද්ද ගත් විටත් එහි විපාක විඳින්න වෙන්නෙත් අපිටම තමයි. ඒ නිසා මාගේ අදහස පළමුව නායකත්වය, පාලකයන් නිවැරදි විය යුතු බවයි.

***ස්තුතියි ස්වාමීන් වහන්ස.***